# අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

## ඉතිහාසය I

පැය එකයි

සැලකිය යුතුයි :
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

**1.** විනය පිටකයට පාලියෙන් ලියන ලද අට්ඨකථාව වනුයේ,
(1) ජාතකට්ඨ කතාව යි. (2) සමන්තපාසාදිකාව යි.
(3) ධම්මපදට්ඨ කතාව යි. (4) අත්ථසාලිනිය යි.

**2.** ශ්‍රී ලංකාව පිළිබඳව අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගීමට උපකාරී කරගත හැකි මූලාශ්‍ර වර්ගය වනුයේ,
(1) ශිලා ලේඛන යි. (2) නාණක සාධක යි. (3) සාහිත්‍ය කෘති යි. (4) කලා නිර්මාණ යි.

**3.** ශ්‍රී ලංකාව අතීතයේ දී ''සෙරන්ඩිබ්'' වශයෙන් හඳුන්වා ඇත්තේ,
(1) අරාබීන් ය. (2) ග්‍රීකයන් ය. (3) රෝම ජාතිකයින් ය. (4) ඉන්දියානුවන් ය.

**4.** තාක්ෂණ භාවිතය, සෞන්දර්යාත්මක බව හා උද්‍යාන නිර්මාණය ඉතා උසස් මට්ටමක පැවති බව සනාථ කළ හැකි ඓතිහාසික ස්ථානය කුමක් ද?
(1) දඹදෙනිය (2) රිටිගල (3) සීගිරිය (4) මිහින්තලය

**5.** පහත සඳහන් පිළිතුරු කාණ්ඩ අතරින් ප්‍රාග් ඓතිහාසික යුගයේ අවමංගල්‍යය සිරිත් විරිත් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි ස්ථාන ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) බෙල්ලන්බැඳිපැලැස්ස හා අත්තනගොඩ අළුලෙන
(2) බටදොඹලෙන හා රාවණා ඇල්ල ලෙන
(3) බටදොඹලෙන හා පාහියන්ගල ලෙන
(4) නිල්ගල බෙලිගල්ගේ හා බෙල්ලන්බැඳිපැලැස්ස

**6.** ආර්ය ජනාවාස ව්‍යාප්තිය පිළිබඳව පහත සඳහන් සිද්ධි ඓතිහාසික අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?
A - භද්දකච්චානා කුමරිය ඇතුළු පිරිස ගොඩබැසීම
B - විජිතගාම, දීඝගාම ජනපද බිහිවීම
C - මදුරාපුර කුමරිය ඇතුළු පිරිස පැමිණීම
D - උපතිස්සගාම, අනුරාධගාම බිහිවීම
(1) D, A, B හා C (2) B,C, A හා D (3) D, B, A හා C (4) D, C, A හා B

**7.** පහත සඳහන් සිද්ධීන් අතරින් වළගම්බා රජුගේ රාජ්‍ය කාලයේ සිදු වූ සිදුවීම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
A - මහා විහාරය ඉදි කිරීම
B - ප්‍රථම පෞද්ගලික ආරාම පූජාව සිදු වීම
C - නිකාය භේදය ඇතිවීම
D - ජේතවන විහාරය ඉදි කිරීම
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා C

**8.** පොළොන්නරු යුගයේ සිදු වූ ඓතිහාසික සිදුවීම් කිහිපයක් ''අ'' තීරුවේ ද ඒ හා සම්බන්ධ පුද්ගල නාම ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' හා ''ආ'' නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

| **''අ'' තීරුව** | | **''ආ'' තීරුව** |
|---|---|---|
| (i) | චෝළ පාලනයෙන් රට මුදා ගැනීම | A කාලිංග මාඝ |
| (ii) | දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව ලබා රාජ්‍යත්වය තහවුරු කර ගැනීම | B නිශ්ශංකමල්ල |
| (iii) | තුලාභාර දාන දීම | C පළමුවන විජයබාහු |
| (iv) | පරාක්‍රම පාණ්ඩ්‍ය පරාජය කිරීම | D පළමුවන පරාක්‍රමබාහු |
| | | E දෙවන විජයබාහු |

(1) C, D, B හා A (2) C, B, D හා E (3) B, C, D හා A (4) D, B, A හා E

[2 වැනි පිටුව බලන්න

**9.** පහත ''අ'' තීරුවේ දැක්වෙන ඇළ මාර්ග ඔස්සේ ජලය ගෙන ගිය ස්ථාන ''ආ'' තීරුවේ දක්වා ඇත. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුර කුමක් ද?


| **''අ'' තීරුව** | **''ආ'' තීරුව** |
|---|---|
| (i) අංග මැඩිල්ල ඇළ | A අඹන් ගඟේ සිට පරාක්‍රම සමුද්‍රයට |
| (ii) යෝධ ඇළ | B මහවැලි ගඟේ සිට අඹන් ගඟට |
| (iii) ඇළහැර ඇළ | C දැදුරු ඔයේ සිට මාගල්ල වැවට |
| (iv) රිදී බැඳි ඇළ | D කලා වැවේ සිට තිසා වැවට |
| | E අඹන් ගඟේ සිට මින්නේරිය ගිරිතලේ වැව්වලට |

(1) A, D, E හා C (2) A, B, E හා C (3) E, B, C හා A (4) E, D, B හා C

**10.** ''පිටදඩහස'', ''මදෙහස'' හා ''අකලහස'' යනුවෙන් වී වගා කළ කන්න තුනක් පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය වන්නේ,

(1) සිතුල්පව්ව (2) කුසලානකන්ද (3) බඹරගල (4) තෝනිගල

- **යාබද ඉන්දියාවේ සිතියම අධ්‍යයනය කොට 11 සිට 12 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




**11.** මගධයේ අගනුවර වන පාඨලී පුත්‍ර නගරය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(1) A
(2) B
(3) C
(4) D

**12.** ක්‍රිෂ්ණා ගංගාව දැක්වෙන්නේ කුමන අංකයෙන් ද?

(1) 1
(2) 2
(3) 3
(4) 4

The National e-Learning Portal for The General Education

**13.** A - තිලෝකසුන්දරී කුමරිය විවාහ කර ගැනීම
B - පඬුවස්දෙව් ඇතුළු පිරිස ලංකාවට පැමිණීම
C - සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස ගෙන්වා ගැනීම
D - සෝමා දේවිය පැහැරගෙන යාම
සිදු වූ ඓතිහාසික අනුපිළිවෙළ අයත් වන පිළිතුර කුමක් ද?

(1) B, D, C හා E (2) B, C, D හා A (3) D, C, A හා B (4) B, C, A හා D

**14.** කාලිංග මාඝ පොළොන්නරුවේ පාලනය කරන අවධියේ ගෝවින්ද මලයෙ හි ස්වාධීන පාලනයක් ගෙන ගිය ප්‍රාදේශීය නායකයා වන්නේ,

(1) සුභ සෙනෙවි ය. (2) සංඛ සෙනෙවි ය.
(3) බුවනෙකබාහු ආදිපාද ය. (4) විජයබාහු ය.

**15.** A - බෙලිගල පර්වතය මුදුනේ දළදා මාළිගයක් කරවීම
B - මහනුවර අස්ගිරි සේනාසනය ආරම්භ කිරීම
C - ජාතක කථා පොත සිංහලට පරිවර්තනය කිරීමට අනුග්‍රහ දැක්වීම
D - චන්ද්‍රභානු දෙවරක් පරාජය කිරීම
ඉහත A, B, C හා D ලෙස දක්වා ඇති ඓතිහාසික සිද්ධි අතරෙන් හතරවන පරාක්‍රමබාහු රජ සමයට අදාළ සිද්ධි ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**16.** යාපහුව රාජධානියේ ප්‍රථම පාලකයා වූයේ,

(1) හතරවන විජයබාහු ය.
(2) පළමුවන බුවනෙකබාහු ය.
(3) හතරවන පරාක්‍රමබාහු ය.
(4) දෙවන බුවනෙකබාහු ය.

[3 වැනි පිටුව බලන්න

**17.** පහත ''අ'' තීරුවේ සඳහන් රජවරු රජවීමට පෙර හඳුන්වන ලද නාමයන් ''ආ'' තීරුවේ සඳහන් වේ. ''අ'' තීරුව ''ආ'' තීරුව සමග නිවැරදිව ගැළපූ විට නිවැරදි වරණය කුමක් ද?

| **''අ'' තීරුව** | | **''ආ'' තීරුව** | |
|---|---|---|---|
| (i) | හයවන බුවනෙක බාහු | A | ටිකිරි බණ්ඩාර කුමරු |
| (ii) | අටවන වීර පරාක්‍රමබාහු | B | මහා අස්ථාන කුමරු |
| (iii) | පළමුවන රාජසිංහ | C | අම්බුළුගල කුමරු |
| (iv) | දෙවන රාජසිංහ | D | සපුමල් කුමරු |

(1) A, C, D හා B (2) D, A, B හා C (3) C, D, B හා A (4) D, C, A හා B

**18.** පළමුවන රාජසිංහ රජුට පෘතුගීසින් මෙරටින් පන්නා දැමීමට **නොහැකි වූ** හේතුව,

(1) රජතුමාට රටවැසියන්ගේ සහාය නොලැබීම

(2) පළමුවන රාජසිංහ රජතුමා ප්‍රබල පාලකයකු නොවීම

(3) පළමුවන රාජසිංහ රජුට නාවික බලයක් නොවීම

(4) ධර්මපාල කුමරු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දීම

**19.** යාබද රූපයෙන් දැක්වෙන්නේ,



(1) මුස්ලිම් ගෘහනිර්මාණයට අනුව ඉදිකල කුතුබ්මිනාර් ය.

(2) මුස්ලිම් ගෘහනිර්මාණයට අනුව ඉදිකල අන්කෝර්වට් ය.

(3) බුරුම සම්ප්‍රදායට අනුව ඉදිකල බුද්ධගයාව ය.

(4) මෝගල් සම්ප්‍රදායට අනුව ඉදිකල ටජ්මහල ය.

**20.** පහත දැක්වෙන ප්‍රකාශ අතරින් යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට හේතු වූ ප්‍රධාන කරුණු ඇතුළත් පිළිතුරු වන්නේ,

A - වෙළෙඳ ආධිපත්‍යය හිමිකර ගැනීම

B - රජවරුන්ගේ කීර්තිය හා බලය තර කර ගැනීම

C - ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කිරීම

D - රජවරුන් නාවික කටයුතු සඳහා අනුග්‍රහ දැක්වීම

(1) A හා C (2) A හා D (3) B හා C (4) C හා D

The National e-learning Portal for The General Education

**21.** A - අධිකරණ කටයුතු වංශාධිපතිවරු සතු වීම

B - ඉඩම් වගා කිරීමෙන් ලැබෙන ආදායම ප්‍රධාන වීම

C - වගාව සඳහා කට්ටිමාරු ක්‍රමය හා ශෂ්‍ය මාරු ක්‍රමය, යොදා ගැනීම

D - උත්පත්තිය මත සමාජ තරාතිරම හිමි වීම

ඉහත තොරතුරු අතරින් යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ ආර්ථික ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**22.** A - බයිබලය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම

B - පල්ලිය විවේචනය කිරීම නිසා මරණයට පත් වීම

A හා B වලින් දැක්වෙන සිදුවීම්වලට ලක්වූ ආගමික දාර්ශනිකයන් පිළිවෙළින් දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?

(1) මාටින් ලූතර්, උල්රිච් ස්වින්ග්ලි

(2) මාටින් ලූතර්, ජෝන් කැල්වින්

(3) ජෝන් වයික්ලිෆ්, ජෝන් හස්

(4) ජෝන් කැල්වින්, ජෝන් හස්

**23.** ඕලන්ද ජාතිකයින්ගේ පෙරදිග බල මූලස්ථානය මින් කුමක් ද?

(1) බතාවිය (2) කල්කටාව (3) ගෝව (4) මදුරාසිය

**24.** යුරෝපා බල ව්‍යාප්තියේ දී ආගම පැතිරවීමේ ප්‍රධාන මාධ්‍යය වූයේ,

(1) වෙළෙඳාම යි. (2) අධ්‍යාපනය යි. (3) සෞඛ්‍යය යි. (4) කෘෂිකර්මය යි.

**25.** පහත දැක්වෙන ''අ''තීරුවේ ඇති ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අනුව ''ආ'' තීරුවේ යෝජනා ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| **''අ'' තීරුව** | **''ආ'' තීරුව** |
|---|---|
| (i) කෝල්බෲක් | A සර්වජන ඡන්ද බලය ලැබීම |
| (ii) ඩොනමෝර් | B ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩි කිරීම |
| (iii) කෲව් මැකලම් | C පළාත් 16, පහකට අඩු කිරීම |
| (iv) සෝල්බරි | D අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් පත් කිරීම |

(1) A, B, C හා D (2) C, A, B හා D (3) C, B, D හා A (4) D, A, C හා B

**26.** පහත ''අ'' හා ''ආ'' තීරු නිවැරදිව ගැළපූ විට කිසියම් සබඳතාවක් ඇත. හොඳින් අධ්‍යයනය කොට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

| **''අ'' තීරුව** | **''ආ'' තීරුව** |
|---|---|
| (i) රතු කමිස හමුදාව | A ප්‍රංශ විප්ලවය |
| (ii) ''යළි ඉපදීම'' කෘතිය | B ඉතාලිය |
| (iii) ''බැස්ටීලයට'' පහර දීම | C කවුන්ට් කැවුවර් |
| (iv) දාසයවන ලුවී රජ | D මාරි ඇන්ටොයිනට් |

(1) B, C, D හා A (2) A, D, B හා C (3) B, C, A හා D (4) A, B, C හා D

**27.** පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් සුභාෂ් චන්ද්‍රබෝස් පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඉන්දියාවේ මුස්ලිම්වරුන් වෙනුවෙන් වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටීම.
(2) බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව රහසේ සේනා සංවිධානය කිරීම.
(3) ''ඉන්දියාවෙන් ඉවත් වෙනු ව්‍යාපාරය'' දියත් කිරීම.
(4) ස්වරාජ්‍ය පක්ෂය පිහිටුවා නිදහස සඳහා සටන් කිරීම.

**28.** මාඕ-සේ-තුං විසින් ''මහා ඉදිරි පිම්ම'' නම් වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලැබුවේ,

(1) කෘෂි ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනයක් ඇති කිරීමට ය.
(2) රටේ ඇති වූ සිවිල් යුද්ධ තත්ත්වය සන්සුන් කිරීමට ය.
(3) කාර්මික අංශයේ විප්ලවීය වෙනසක් ඇති කිරීමට ය.
(4) ජයග්‍රාහී විප්ලවකාරී සම්ප්‍රදායයන් රැක ගැනීමට ය.

The National e-Learning Portal for The General Education

**29.** පහත ''අ'' තීරුවේ දැක්වෙන ක්ෂේත්‍ර සමග ''ආ'' තීරුවේ දැක්වෙන පුද්ගලයන් නිවැරදි පිළිවෙළින් ගළපා ඇති පිළිතුර කුමක් ද?

| **''අ'' තීරුව** | **''ආ'' තීරුව** |
|---|---|
| (i) සාහිත්‍යය | A මයිකල් ආන්ජිලෝ |
| (ii) වෛද්‍ය විද්‍යාව | B ඇමරිගෝ වෙස්පූෂි |
| (iii) චිත්‍ර ශිල්පය | C තෝමස් මුවර් |
| (iv) තාරකා විද්‍යාව | D පැරසල්සස් |
| | E ගැලිලියෝ ගැලිලි |

(1) A, B, D හා E (2) B, A, C හා E (3) C, D, A හා E (4) C, E, A හා B

**30.** වාරි කර්මාන්තය පිළිසකර කර ගොවිතැන් කටයුතු නගා සිටුවීමට සහය දැක්වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු ''අ'' තීරුවේ ද ඔවුන් පිළිසකර කළ වැව් ''ආ'' තීරුවේ ද දැක් වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

| **''අ'' තීරුව** | **''ආ'' තීරුව** |
|---|---|
| (i) හෙන්රි වෝඩ් | A කන්තලේ |
| (ii) හර්කියුලස් රොබින්සන් | B නාච්චදූව |
| (iii) විලියම් ග්‍රෙගරි | C ඉරක්කාමම් |
| (iv) වෙස්ට් රිජ්වේ | D තිස්සමහාරාම |

(1) C, B, D හා A (2) C, D, A හා B (3) C, A, B හා D (4) D, A, C හා B

**31.** ප්‍රථම ලෝක සංග්‍රාමයට ආසන්න ම හේතුව වූයේ,

(1) සරයේවෝ සිද්ධිය යි. (2) ඇල්සාස් - ලොරේන් ප්‍රශ්නය යි.
(3) බිස්මාර්ක්ගේ ගිවිසුම් ප්‍රතිපත්තිය යි. (4) යටත් විජිත සඳහා වූ තරගය යි.

**32.** මොරොක්කෝව සම්බන්ධයෙන් ප්‍රංශය හා ස්පාඤ්ඤය අතර වූ තරගයේ දී ප්‍රංශයට අවාසි වන ලෙස ස්පාඤ්ඤයට උදව් කළ ජර්මන් අධිරාජයා වූයේ,

(1) විලියම් කෛසර්ය. (2) ඔටෝවෝන් බිස්මාර්ක් ය.
(3) ඇඩොල්ෆ් හිට්ලර් ය. (4) නැපෝලියන් බොනපාට් ය.

**33.** අග්‍රාණ්ඩුකාරධූරය වෙනුවට නාමමාත්‍ර ජනාධිපතිධූරයක් ඇති කිරීම සිදු කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන්නේ,

(1) ඩොනමෝර් (2) සෝල්බරි (3) ප්‍රථම ජනරජ (4) දෙවන ජනරජ

**34.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ජනතා පරමාධිපත්‍යය යනුවෙන් අදහස් වන්නේ,

(1) විධායක බලය යි. (2) ව්‍යවස්ථාදායක බලය යි. (3) අධිකරණ බලය යි. (4) උත්තරීතර බලය යි.

**35.** පහත සඳහන් අවස්ථා අතුරෙන් සමස්ත දිවයිනම එක් ඡන්ද කොට්ඨාසයක් ලෙස ක්‍රියාත්මක වන්නේ කුමන අවස්ථාවලදී ද?

A - මහා මැතිවරණය
B - ජනාධිපතිවරණය
C - ජනමත විචාරණය
D - පළාත් පාලන මැතිවරණය

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**36.** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමානුපාතික නියෝජන ක්‍රමයේ ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

A - ඡන්ද අපේක්ෂකයෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වීම
B - අදාළ දේශපාලන පක්ෂයට තම ඡන්දය දී තමා කැමති අපේක්ෂකයන්ට මනාපය සටහන් කිරීම
C - එක් මැතිවරණ කොට්ඨාසයකට එක් පක්ෂයකින් එක් අපේක්ෂකයකු පමණක් ඉදිරිපත් වීම
D - විවිධ ඡන්ද කොට්ඨාසවලට තෝරා ගනු ලබන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කල්තියාම තීරණය කිරීම

(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

**37.** වර්තමාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සංඛ්‍යාව වන්නේ,

(1) 220 කි. (2) 196 කි. (3) 225 කි. (4) 248 කි.

**38.** ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ආරම්භක අධිකරණයක් වන්නේ මින් කුමක් ද?

(1) අභියාචනා අධිකරණය (2) සමථ මණ්ඩලය (3) ශ්‍රේෂ්ඨාධිකරණය (4) මහාධිකරණය

**39.** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ රාජකාරී ක්‍රමය අවලංගු කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

(1) විලියම් ග්‍රෙගරි ය. (2) ෆෙඩ්රික් නෝර්ත් ය.
(3) තෝමස් මෙට්ලන්ඩ් ය. (4) එඩ්වඩ් බාන්ස් ය.

**40.** A - ජපානයේ ආක්‍රමණකාරී ප්‍රතිපත්තිය
B - ලුසිටානියා නැව ගිල්වා දැමීම
C - ඉතාලියේ මුසෝලිනීගේ ක්‍රියාකලාපය
D - චීනයේ මැංචූ අධිරාජ්‍යය, ජපානය විසින් අත්පත් කර ගැනීම

ඉහත A, B, C හා D අතරෙන් දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වීමට හේතු වූ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

***

# අ.පො.ස.(සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

**ඉතිහාසය II** | පැය තුනයි

සැලකිය යුතුයි :

* **I** කොටසේ පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
* **II** කොටසින් ප්‍රශ්න තුනකට ද **III** කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** **(අ)** පහත **(i)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ශ්‍රී ලංකා** සිතියමෙහි ද **(ii)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ලෝක** සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

**(i)** මහානාගහුල, තබ්බෝව වැව, මිණිපේ අමුණ, මහා තිත්ථ, කිරිඳි ඔය, අම්බතිත්ථ, ගම්පොල, පුලස්තිනගර, සීගිරිය, ඌරාතොට (ලකුණු 10යි)

**(ii)** ඉතාලිය, සූවස් ඇළ, භාරුකච්ච, බුරුමය, බීජිං, මහානදී, ලන්ඩන්, පර්සියන් බොක්ක (ලකුණු 08යි)

**(ආ) (i)** පහත *A, B, C, D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් පිළිවෙළින් සඳහන් කරන්න.

*A* - එළාර නම් වූ සොළී නායකයා ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ සමයේ අනුරාධපුර පාලකයාව සිටි රජතුමා

*B* - මාතලේ අළුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ සමයේ සිටි රජතුමා

*C* - දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ කොන්දේසි විරහිතව යටත් වූ ජපන් අධිරාජයා

*D* - 1917 දී ඔක්තෝම්බර් විප්ලවය ජයගෙන සෝවියට් රුසියාව බිහිකල සමාජවාදී නායකයා

(ලකුණු 04යි)

* දී ඇති පින්තූර අධ්‍යයනය කොට, පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු, ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



**(ii)** 1. යාබද රූපයේ දැක්වෙන ගොඩනැගිල්ල නම් කරන්න.

2. එය කුමන රටක පිහිටියේ ද?

3. කුමන කාර්යයක් සඳහා ඉදිකර තිබේ ද?

4. මෙම ගොඩනැගිල්ල **චිත්‍රවලින්** අලංකාර කල කලාකරුවෙකු නම් කරන්න.

(ලකුණු 04යි)



**(iii)** 1. යාබද රූපයේ දැක්වෙන ගොඩනැගිල්ලේ නම කුමක් ද?

2. එය කුමන රටක ඉදිකර තිබේ ද?

3. කුමන කාර්යයක් සඳහා යොදා ගනු ලබන්නේ ද?

4. 1947 දී මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමට පුරෝගාමී වූ පුද්ගලයාගේ නම කුමක් ද?

(ලකුණු 04යි)

[2 වැනි පිටුව බලන්න

# II කොටස

**2.** **(i)** පහත *A*, *B* හා *C* වලින් දැක්වෙන ග්‍රන්ථ රචනා කළ කතුවරු නම් කරන්න.

*A* - ඩිමුන්ඩෝ *B* - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය *C* - පර්සියානු යුද්ධ

(ලකුණු 03යි)

**(ii)** පහත සඳහන් එක් එක් ඓතිහාසික කරුණු අනාවරණය වන ශිලා ලේඛනය වරහන් තුළින් තෝරා ලියන්න.

*A* - වෙළෙඳ ශ්‍රේණි හා කර්මාන්ත *B* - වෙළෙඳපොළ පාලනය

*C* - අධිකරණයෙන් ලැබූ ආදායම, විහාරයට හිමිකර දීම *D* - ආරාම පාලනය

(පෙරිමියන්කුලම්, බඹරගල, කළුදිය පොකුණ, සිතුල් පව්ව, ගොඩවාය, බදුලුටැම් ලිපිය, යටහලෙන, රිටිගල)

(ලකුණු 04යි)

**(iii)** මහසෙන් රාජ්‍යය සමයේ

*A* - ආර්ථික

*B* - ආගමික

වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 2 + 3 = ලකුණු 05යි)

**(iv)** අනුරාධපුර රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**3.** **(i)** පහත දැක්වෙන වැව් ඉදිකළ රජවරුන් පිළිවෙළින් නම් කරන්න.

*A* - හුරුළු *B* - පදවිය *C* - කන්තලේ (ලකුණු 03යි)

**(ii)** පහත *A*, *B*,*C* හා *D* ලෙස දක්වා ඇත්තේ වැවක අංගවලින් කෙරෙන කාර්යයන් කීපයකි. එම කාර්යයන් ඉටු කරන අංග වරහන තුළින් තෝරා පිළිවෙළින් ලියන්න.

*A* - වැවේ ජලය කෙත්බිම් කරා ගෙනයාම පිණිස වාරි ඇළට ජලය මුදා හැරීම

*B* - ජලය පිටතට යැවීමේ දී වැව් බැම්මට වන හානිය අවම කිරීම

*C* - පිටවාන දුර්වල වී කැඩී ගියහොත් වැවේ ජලය මුළුමනින්ම බැසයාම වැළැක්වීම

*D* - අතිරික්ත වර්ෂා ජලය, වැවට ගලා ඒම වැළැක්වීම

(පිටවාන, කළිඟු බැම්ම, ඇතුළුවාන, බිසෝකොටුව, සොරොව්ව, සළපනාව, ඉස්වැටි, කුළු වැව්) (ලකුණු 04යි)

**(iii)** දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා දඹදෙණි යුගයේ ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකීමට බලපෑ

*A* - දේශපාලන *B* - ආගමික

සේවාවන් **එක** බැගින් විස්තර කරන්න. (ලකුණු 2 + 3 = ලකුණු 05යි)

**(iv)** නිරිත දිග රාජධානි සමයේ ජන සමාජයේ පැවති

*A* - සංස්කෘතික *B* - ආර්ථික

ලක්ෂණ **එක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 2 + 4 = ලකුණු 06යි)

**4.** **(i)** ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත *A*, *B* හා *C* වලින් දැක් වේ. එම සිදුවීම්වලට අදාළ වර්ෂ වරහන් තුළින් තෝරා ලියන්න.

*A* - පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම

*B* - ලන්දේසි හා දෙවන රාජසිංහ රජු අතර ගිවිසුමක් ඇති වීම

*C* - ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය අල්ලා ගැනීම

(ක්‍රි.ව. 1500, ක්‍රි.ව. 1505, ක්‍රි.ව. 1638, ක්‍රි.ව. 1766, ක්‍රි.ව. 1803, ක්‍රි.ව. 1815) (ලකුණු 03යි)

**(ii)** පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ආගමික පුනර්ජීවනයේ සිද්ධි කීපයකි. ඒවාට පුරෝගාමී වූ පුද්ගලයන් පිළිවෙළින් නම් කරන්න.

*A* - මහාබෝධි සමාගම පිහිටුවීම

*B* - ඉරුදින දහම් පාසල් ඇරඹීම

*C* - පර්සිවල් දේවගැතිවරයා හා එක්ව බයිබලය දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම

*D* - මද්රාසා නම් වූ මුස්ලිම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය කිරීම (ලකුණු 04යි)

**(iii)** ශ්‍රී ලාංකිකයන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට හුරු කරවීම සඳහා ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හේතු වූ ආකාරය කරුණු **දෙකක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ පාරම්පරික කෘෂිකර්මය පිරිහීමට බලපෑ කරුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

[3 වැනි පිටුව බලන්න

**5.** **(i)** *A* - සීතාවක රාජ්‍යයට එරෙහිව ''මුල්ලේරියා සටන'' ට නායකත්වය දුන් පෘතුගීසි සෙන්පතියා
*B* - පෘතුගීසීන්, ශ්‍රී ලංකාවට පැමිණෙන විට යාපන රාජ්‍යයේ පාලකයා
*C* - වීරසුන්දර බණ්ඩාර ව, බොරුවලක දමා ඝාතනය කරවනු ලැබූ සීතාවක පාලකයා
ඉහත සඳහන් කරුණු හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03යි)

**(ii)** *A* - දෙවන රාජසිංහ රජතුමා සමග සාමකාමීව කටයුතු කිරීම
*B* - කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමග ක්‍රි.ව. 1766 දී ගිවිසුමකට එළඹීම
*C* - සිවිල් නිලධාරීන්ට සිංහල හා දෙමළ භාෂා ප්‍රවීණතාව අනිවාර්යය කිරීම
*D* - වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම
ඉහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ ආණ්ඩුකාරවරුන්ගේ නම් වරහන් තුළින් තෝරා පිළිවෙළින් ලියා දක්වන්න.
(ජොරිස් ෆන් ස්පිල්බර්ජන්, වෙස්ට් රිජ්වේ, තෝමස් මේට්ලන්ඩ්, ලෝරන්ස් ෆිල්, රොබට් බෲවුන්රිග්, විලෙම් ෆැල්ක්, ෆන් එංගල්බෙක්, ෆෙඩ්රික් නෝර්ත්) (ලකුණු 04යි)

**(iii)** ''කෝට්ටේ රාජ්‍යයේ පරිහානියට දොන් ජුවන් ධර්මපාල රජුගේ ක්‍රියාකලාපය බලපෑ ආකාරය'' කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

**(iv)** ලන්දේසීන්ට ශ්‍රී ලංකාවේ වෙළෙඳ බලය තහවුරු කර ගැනීම සඳහා 1766 අත්සන් කළ ගිවිසුමේ කොන්දේසි හේතු වූ බව නිදසුන් **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2 + 4 = ලකුණු 06යි)

**6.** **(i)** පහත සඳහන් වර්ෂවල පැවති මහමැතිවරණවලින් පසු ශ්‍රී ලංකාවේ බලයට පත් අග්‍රාමාත්‍යවරුන්ගේ නම් වරහන තුළින් තෝරා ලියන්න.
*A* - 1947 *B* - 1956 *C* - 1965
(විජයානන්ද දහනායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, ඩී.එස්. සේනානායක, ජේ.ආර්. ජයවර්ධන, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක) (ලකුණු 03යි)

**(ii)** 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් මූලික මිනිස් අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** **(අ)** 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නියෝජන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
**(ආ)** ඉන් **එකක්** ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** 1978 ව්‍යවස්ථාවට අනුව
*A* - පාර්ලිමේන්තුව
*B* - කැබිනට් මණ්ඩලය
ඉහත *A* හා *B* සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු බලතල **එක** බැගින් විස්තර කරන්න.
(ලකුණු 3 × 2 = ලකුණු 06යි)

## III කොටස

**7.** **(i)** වෛදික යුගයේ ආර්යයන් ඇදහූ, දෙවිවරු **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** පහත *A, B, C* හා *D* ලෙස දක්වා ඇති ප්‍රකාශවලට සම්බන්ධ රජවරුන් වරහන් තුළ දී ඇති නම් අතුරෙන් තෝරා පිළිවෙළින් ලියන්න.
*A* - පාඨලීපුත්‍ර නගරය මගධයේ අගනුවර කිරීම
*B* - නන්ද රාජවංශය ආරම්භ කිරීම
*C* - සෙලියුකස් නිකේටර් සමග සටන් කර වයඹ දිග ඉන්දියාව යටත් කර ගැනීම
*D* - හතරවන ධර්ම සංඝායනාව පැවැත්වීමේ මූලිකත්වය ගැනීම
(බිම්බිසාර, මහා පද්මනන්ද, අජාසත්, සමුද්‍ර ගුප්ත, චන්ද්‍ර ගුප්ත මෞර්ය, කණිෂ්ක, ධනනන්ද, අශෝක)
(ලකුණු 04යි)

**(iii)** මගධ රාජ්‍යයේ බල ව්‍යාප්තිය කෙරෙහි බිම්බිසාර රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** ගුප්ත යුගයේ පැවති
*A* - අධ්‍යාපනික
*B* - සාහිත්‍ය
යන ක්ෂේත්‍රවල ඇති වූ දියුණුව පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**8.** **(i)** පුනරුද සමයේ දී සිදු වූ විද්‍යාත්මක සොයා ගැනීම් තුනක් පහත දැක් වේ. එම සොයා ගැනීම්වල නිර්මාතෘවරු කවුරුන් දැයි වරහන් තුළ දී ඇති නම් අතුරෙන් තෝරා පිළිවෙළින් ලියන්න.

*A* - සූර්ය කේන්ද්‍ර වාදය *B* - ග්‍රහලෝකවල ඉලිප්සාකාර ගමන් මාර්ගය *C* - දුර දක්නය

(ගැලිලියෝ ගැලිලි, මයිකල් සර්වෙතස්, ජොහැන්නස් කෙප්ලර්, නිකලස් කොපර්නිකස්, තෝමස් මුවර්, ගුටෙන්බර්ග්) (ලකුණු 03යි)

**(ii)** පුනරුද සමයේ කලා ක්ෂේත්‍රයේ දියුණුවට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** දේශ ගවේෂණ ව්‍යාපාරය නිසා ලෝකයේ **දේශපාලන** හා **ආර්ථික** ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් **එක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** **(අ)** යුරෝපයේ ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණවලට පුරෝගාමී වූ පුද්ගලයන් **දෙදෙනෙකු** නම් කරන්න.

**(ආ)** ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල ලෙස යුරෝපා සමාජයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**9.** **(i)** ඉන්දියානු ජාතික කොංග්‍රසයේ සටන්කාමී නායකයින් **තිදෙනෙකු** වරහන තුළ දී ඇති නම් අතුරින් තෝරා ලියන්න.

(බාල් ගංගාධාර් තිලක්, සුරේන්ද්‍රනාත් බැනර්ජී, බිපින් චන්ද්‍රපෝල්, දඩාභායි නඖරෝජී, ලාලා ලජ්පත් රායි, ගෝපාල් ක්‍රිෂ්ණ ගෝඛලේ) (ලකුණු 03යි)

**(ii)** ක්‍රි.ව. 1857 වර්ෂයේ බ්‍රිතාන්‍යයන්ට එරෙහිව පැන නැගුණු ඉන්දියානු හමුදා කැරැල්ලට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

**(iii)** ඉන්දියාවට නිදහස ලබා ගැනීම සඳහා මහත්මා ගාන්ධිතුමා අනුගමනය කළ අවිහිංසාවාදි ක්‍රියා මාර්ග **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** මෙයිජි ප්‍රතිසංස්කරණ සමයේ ජපන් ආර්ථිකයේ ඇති වූ වෙනස්වීම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

**10.** **(i)** පළමුවන ලෝක සංග්‍රාමයේ දී මිත්‍ර පිලට අයත් වූ රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

**(ii)** පළමුවන ලෝක සංග්‍රාමයට තුඩුදුන් හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)


**(iii)** ලෝක සාමය ඇති කිරීමේ අරමුණින් පිහිටු වූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු වූ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(iv)** ''නිරවියුධ සමයේ බලකඳවුරු දෙක අතර ඇති වීමට ගිය අවි ගැටුම් එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වීමෙන් වළක්වා ගෙන ඇත''. එවැනි අවස්ථා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

***

අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

**1.** (අ) (i)



**1.** (අ) (ii)

